# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## ශ්‍රී ලංකා ධීවර හා ජලජ සම්පත් සංගමය
## (සංස්ථාගත කිරීමේ)

**ශ්‍රී ලංකා ධීවර හා ජලජ සම්පත් සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

---

ගම්පහ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු චතුර සන්දීප සේනාරත්න මහතා විසින්
2015 දෙසැම්බර් මස 03 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2015 සැප්තැම්බර් මස 21 වැනි දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

[35 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

**මිළ : රු. 6.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 10.00 යි.**

2—PL 009502—225 (2015/12)

# ශ්‍රී ලංකා ධීවර හා ජලජ සම්පත් සංගමය (සංස්ථාගත කිරීමේ)

## ශ්‍රී ලංකා ධීවර හා ජලජ සම්පත් සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

පූර්විකාව.

"ශ්‍රී ලංකා ධීවර හා ජලජ සම්පත් සංගමය" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන සංගමයක් ධීවර හා ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන කටයුතුවල නියුක්ත වූ අය අතර අන්‍යෝන්‍ය ඵලදායි ක්‍රියාකාරිත්වය සහ සහයෝගය ප්‍රවර්ධනය සඳහා ද සාමාජිකත්වය විසින් එකඟ වූ ව්‍යවස්ථාව අනුව එකී සංගමයේ පරමාර්ථ සහ සංගමය සම්බන්ධ සියලු කරුණු ඵලදායි ලෙස ඉෂ්ට කරගැනීම සඳහා ද, පිහිටුවා ඇති හෙයින් ද,

"ශ්‍රී ලංකා ධීවර හා ජලජ සම්පත් සංගමය" යන නමින් හඳුන්වනු ලබන එකී සංගමය ස්ථාපිත කරනු ලැබූ විවිධ අරමුණු සහ කාර්යයන් ඵලදායි ලෙස ඉටු කර ගැනීම හැකිවනු පිණිස එකී සංගමය ස්ථාපිත කිරීම සඳහා ඉල්ලුම් කොට ඇති හෙයින් ද, එකී ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත සඳහා වන හෙයින් ද,

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

1. මේ පනත 2015 අංක     දරන ශ්‍රී ලංකා ධීවර හා ජලජ සම්පත් සංගමය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ශ්‍රී ලංකා ධීවර හා ජලජ සම්පත් සංගමය සංස්ථාගත කිරීම.

2. මෙහි මින් මතු "සංගමය" යනුවෙන් සඳහන් කරනු ලබන ශ්‍රී ලංකා ධීවර හා ජලජ සම්පත් සංගමයේ දැනට සිටින තාක් සාමාජිකයන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු ඇතුළත් කරගනු ලබන සාමාජිකයන් (ඔවුන් සාමාජිකත්වයෙහි රැඳී සිටින තාක්) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වූ දින සිට සහ ඉන් පසු "ශ්‍රී ලංකා ධීවර හා ජලජ සම්පත් සංගමය" යන නාමය සහ අභිධානය යටතේ (මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) අවිච්ඡින්න සංස්ථාවක් බවට පත්වන්නේ ය. තව ද, එකී සංස්ථාපිත නාමයෙන් සංස්ථාව විසින් ද, ඊට විරුද්ධව ද සියලු අධිකරණවල නඩු පැවරිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද, එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය.

2—PL 009217—300 (2015/09)

සංස්ථාවේ පොදු පරමාර්ථ.

**3.** සංස්ථාව ස්ථාපිත කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, ඒ පොදු පරමාර්ථ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ:—

(අ) ශ්‍රී ලංකා ධීවර හා ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන කටයුතුවල නියුක්ත වූ අය අතර, ඵලදායි අන්‍යෝන්‍ය ක්‍රියාකාරිත්වය සහ සහයෝගය ප්‍රවර්ධනය කිරීම;

(ආ) ශ්‍රී ලංකාවේ එවැනි කටයුතු පිළිබඳ උනන්දුවක් දක්වන රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන සමග සහසම්බන්ධව සහයෝගයෙන් කටයුතු කිරීම;

(ඇ) ශ්‍රී ලංකාවේ ජලජ සම්පත් විධිමත් ලෙස උපයෝගී කර ගැනීම, වගා කිරීම, සංරක්ෂණය හා සංවර්ධනය කළ යුතු ආකාරය මෙන් ම එහි ඇති වැදගත්කම පිළිබඳව අවබෝධයක් ඇති කරවීම සහ ප්‍රචාරය කිරීම;

(ඇ) ජලජ සම්පත් සංවර්ධනය සහ සංරක්ෂණය හා සම්බන්ධ ගැටලු හා ප්‍රතිපත්ති සාකච්ඡා කිරීම සඳහා විද්‍යාඥයන්ට සහ වෙනත් පුද්ගලයන්ට වේදිකාවක් ලෙස කටයුතු කිරීම; සහ

(ඉ) අනෙකුත් විද්‍යාත්මක සංවිධාන සමග සම්බන්ධතා ගොඩ නගා ගැනීම;

සංස්ථාවේ පොදු බලතල.

**4.** මේ පනතේ විධිවිධානයන්ට සහ වෙනත් ඕනෑම ලිඛිත නීතියකට යටත්ව බැංකු ගිණුම් විවෘත කිරීම, ක්‍රියාත්මක කිරීම සහ වසා දැමීම ද ඇප මත හෝ ඇප නොමැතිව ණය ගැනීමේ හෝ අරමුදල් උපයා ගැනීම ද, ප්‍රදානයන් ලබා ගැනීම හෝ එකතු කර ගැනීම ද, එහි අරමුදල් ආයෝජනය කිරීම ද, සංස්ථාවේ අරමුණු ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය පිරිස් බඳවා ගැනීම, සේවයේ නියුක්ත කරවීම සහ සේවයෙන් නෙරපා හැරීම ද ඇතුළුව සංස්ථාවේ අරමුණු ප්‍රවර්ධනය හෝ වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාව සඳහා අවශ්‍ය ඕනෑම කරුණක්, ක්‍රියාවක්, දෙයක් ඉටු කිරීම හෝ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය බලතල සංස්ථාව සතු වන්නේ ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය.

**5.** (1) සංස්ථාවේ කටයුතු, සංස්ථාවේ ව්‍යවස්ථාවට යටත්ව නිලධාරීන්ගෙන් හා සංස්ථා ව්‍යවස්ථාවෙන් ඉඩ සලසා ඇති වෙනත් පුද්ගලයන්ගෙන් සමන්විත තෝරා පත් කර ගන්නා ලද විධායක කාරක සභාවක් විසින් පරිපාලනය කරනු ලැබිය යුතු ය.

(2) මෙම පනත ක්‍රියාත්මකවීමේ දී ආරම්භක දිනය වනවිට තනතුරු දරනු ලබන සංගමයේ විධායක කාරක සභාව, සංස්ථාවේ ප්‍රථම විධායක කාරක සභාව වන්නේ ය.

සංස්ථාවේ නොඅඩු වගන්ති.

**6.** (1) සංස්ථාව විසින් කලින් කල සාමාජිකයන්ගේ වාර්ෂික මහා සභා රැස්වීමක දී එහි පැමිණ සිටින සහ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙපංගුවක ඡන්දයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය සම්බන්ධයෙන් සහ එකී පරමාර්ථ මුදුන්පත් කරගැනීම සම්බන්ධයෙන් මෙම පනතේ විධිවිධානවලට ද, වෙනත් යම් ලිඛිත නීතියකටද අනනුකූල නොවන වගන්ති පැනවීම නීත්‍යනුකූල වන්නේ ය. එවැනි රැස්වීමක දී එවැනි ආකාරයකින් සකස් කරගන්නා ව්‍යවස්ථා වගන්තිවලට යටත් එකතු කිරීම් හෝ යම් වගන්තියක් වෙනස් කිරීම හෝ සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම හෝ කළ හැකි ය.

(2) සංස්ථාවේ සාමාජිකයෝ සංස්ථාවේ ව්‍යවස්ථාවේ වගන්තිවලට යටත් විය යුතු ය.

දේපළ අත්කර ගැනීමට හා අරමුදල් උපයා ගැනීමට ඇති බලය.

**7.** (1) සංස්ථාවේ කාර්ය සඳහා අවශ්‍ය වූ ද, ඒ කාර්යය සඳහා නීත්‍යනුකූලව මිලයට ගැනීමෙන්, ත්‍යාග, අන්තිම කැමැති පත්‍රයකින් හිමි කළ හෝ රික්තාවරණයකින් හුවමාරුවකින් හෝ වෙනත් මාර්ගයකින් නිශ්චල හෝ චංචල දේපළක් අත්කර ගැනීමට ද එසේ අත්කර ගත් හෝ අයිති ඇති දේපළක් පිළිබඳව සුදුස්සක් කිරීමට ද සංස්ථාවට බලය ඇත්තේ ය.

(2) සංස්ථාවේ පරමාර්ථ මුදුන්පත් කරගැනීම සඳහා අවශ්‍ය අරමුදල් ණයට ගැනීමට හෝ රැස් කිරීමට හෝ එවැනි මුදලක් ලබා ගැනීම සඳහා උකස්කරයක්, බැඳුම්කරයක් හෝ ඇපකරයක් ඇති කිරීමට, ක්‍රියාත්මක කිරීමට ප්‍රදානය කිරීමට හෝ නිකුත් කිරීමට සංස්ථාවට බලය ඇත්තේ ය.

(3) මෙම පනතේ හෝ ව්‍යවස්ථාවේ වගන්ති ප්‍රකාරව සංස්ථාව විසින් අත්කර ගන්නා හෝ ඊට අයිතිව ඇති චංචල හෝ නිශ්චල සියලු දේපළ සංස්ථාවේ පරමාර්ථ මුදුන්පත් කරගැනීම සඳහා ව්‍යවස්ථාවේ වගන්තිවලට යටත්ව දැරීම, පරිහරණය කිරීම, පාවිච්චිය සහ යෙදවීමට මෙන්ම ව්‍යවස්ථාවේ එවැනි වගන්තිවලට යටත්ව

කලින් කල එවැනි යම් දේපළක් මිළ දී ගැනීමට, විකිණීමට, ප්‍රදානය කිරීමට, පවරා දීමට, රික්තාවරණය කිරීමට, හුවමාරු කිරීමට හෝ වෙනත් ක්‍රමයකින් බැහැර කිරීමට ද, එවැනි දේපළක් උකස් කිරීමට ද සංස්ථාවේ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා සංගමයේ අරමුදල් ආයෝජනය කිරීමට ද බලය ඇත්තේ ය.

**ගාස්තු සහ දායක මුදල් අයකර ගැනීමට ඇති බලය.**

**8.** පහත සඳහන් අයකිරීම් කිරීමට සංස්ථාවට බලය ඇත්තේ ය:—

(අ) සංස්ථාව විසින් පවත්වනු ලබන යම් පාඨමාලාවකට හෝ විභාගයකට ඇතුළුවීම සඳහා සංස්ථාව විසින් සාධාරණ යැයි සලකනු ලබන ගාස්තු;

(ආ) සංස්ථාවේ කිසියම් සාමාජික පන්තියකට තැනැත්තන් පත්කර ගැනීම සඳහා ගාස්තු; සහ

(ඇ) සංස්ථාව විසින් සලසනු ලබන යම් සේවාවක් වෙනුවෙන් සංස්ථාව විසින් සාධාරණ යැයි සලකනු ලබන එවැනි දායක මුදල් හෝ ගාස්තු.

**සංස්ථාව විසින් ගෙවිය යුතු සහ සංස්ථාවට අයවිය යුතු ණය.**

**9.** මෙම සංස්ථාව ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනට පැවැති සංගමයේ සියලු ණය හා බැරකම් සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර, එදිනට සංගමයට අයවිය යුතුව ඇති සියලු ණය සහ ගෙවිය යුතුව ඇති සියලු දායක මුදල් සහ ගාස්තු මේ පනතේ කාර්යය සඳහා මෙයින් සංස්ථාගත කරනු ලබන සංස්ථාවට ගෙවිය යුතු ය.

**කමිටු පත් කිරීම.**

**10.** කලින් කලට සිය පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා ඕනෑම කමිටුවක් පත් කිරීමට සහ අවශ්‍ය යැයි හැඟෙන පරිදි වෙනත් එවැනි පියවර ගැනීමට සංස්ථාවට බලය ඇත්තේ ය.

**සංස්ථාවේ මුද්‍රාව.**

**11.** සංස්ථාවේ මුද්‍රාව කලින් කලට ස්ථාවර නියෝග මගින් කාරක සභාව විසින් බලය ලබා දෙනු ලබන පුද්ගලයන් ඉදිරියේ හැර කවර හෝ සාධන පත්‍රයකට නොතැබිය යුතු ය. එවැනි තැනැත්තන් ඒ අවස්ථාවේ දී පැමිණ සිටි බවට සලකුණක් වශයෙන් ඒ සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු අතර, ඒ අත්සන් කිරීම සාක්ෂිකරු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සනට පරිබාහිරව විය යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අතියිවාසිකම් ආරක්ෂා කිරීම.

**12.** මේ පනතේ සඳහන් තැනැත්තන්ගේ හා ඔවුන් මගින්, ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන්නවුන්ගේ අයිතිවාසිකම්වලට හැර ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තන්ගේ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**13.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.